මහාචාර්ය ඇස්. බී. හෙට්ටිආරච්චි අභිනන්දනය

පුරාවිද්‍යා, ඉතිහාස, බෞද්ධ අධ්‍යයන හා මානවවිද්‍යා ලිපි එකතුව

# Festschrift
# *for*
# Professor S. B. Hettiaratchi

ESSAYS ON ARCHAEOLOGY, HISTORY,
BUDDHIST STUDIES & ANTHROPOLOGY

Editor-in-Chief

**Prashantha Perera**

Co-editors

**Praneeth N. de S. Abhayasundere**
**Prashantha B. Mandawala**

September, 2010

sarasavi Publishers
30 Stanley Thilakaratne Mawatha, Nugegoda, Sri Lanka

# ඌවේ මුල්කාලීන ඉංග්‍රීසි පාලනය සහ මහ කැරැල්ලේ පසුබිම

අනුර මනතුංග

1818 උඩරට මහ කැරැල්ලේ කේන්ද්‍රස්ථානය වූයේ ඌවයි. ඉංග්‍රීසීන් උඩරට පාලනය අරඹා වසර තුනක් සම්පූර්ණවීමටත් පෙර, ඌව ඉංග්‍රීසීන්ට විරුද්ධව නැගී සිටියේ ය. මේ නැගිටීම සඳහා පසුබිම් වූ කරුණු, ඉංග්‍රීසීන් ඌව පාලනය කළ ආකාරය තුළින් සොයා බැලීම මේ ලිපියේ අරමුණ ය. මේ සඳහා මහනුවර සිටි ඉංග්‍රීසීන්ගේ ප්‍රධාන නේවාසික නියෝජිතයා වූ **ජෝන් ඩොයිලි** විසින් බදුල්ලේ ඉංග්‍රීසි ඒජන්තවරයා වූ **හෙන්රි රයිට්** වෙත 1816 වර්ෂය පුරා ලියන ලද ලිපි මූලාශ්‍රය කොටගනු ලැබී ය.

1815 දී ඉංග්‍රීසීන් උඩරට අත්පත් කර ගැනීමත් සමග ඌවට ඇතුලු වූ ඉංග්‍රීසීන්ගේ හමුදාව ඌවේ දේපළ ඉතා දරුණු ලෙස කොල්ලකන ලද බව මේ ලිපිවලින් පැහැදිලි වන එක් ප්‍රධාන කරුණකි. මේ කොල්ලය කෙතරම් දරුණු වීද යත් බදුලු කොටුව ආශ්‍රිත ප්‍රදේශය ජනශූන්‍ය වූ අතර, එය අතහැර ගොස් සිටි වැසියන්ට නැවත පැමිණ එහි පදිංචිවන ලෙස 1816 ජුලි මාසයේදී ඉල්ලා සිටීමටත්, ඒ සඳහා පෙළඹවීමක් ලෙස විනාශ වූ දේපළ පිළිසකර කර ගැනීම සඳහා දීමනාවක් ලබාදීමටත් ඉංග්‍රීසීන්ට සිදුවීමෙන් පැහැදිලි ය.[1]

යකඩ නිෂ්පාදනය කළ ගමක් වූ **සොලබෙවත්ත** ගම ද මෙලෙස අත්හැර දමා ගොස් තිබිණි. **පිලැස්ස, පල්ලේගම සහ කිනිගම්මඩුව** යන අනෙක් ගම්වල යකඩ නිෂ්පාදන කටයුතු ද ඇණහිට තිබිණි. සොලබෙවත්ත හැරගිය මිනිසුන් යළි එහි කැඳවීමටත්, අනෙක් ගම්වල යකඩ නිෂ්පාදන කටයුතු ඇරඹීමටත් 1816 ජනවාරි මස අවසානයේ දී බදුල්ලේ ඒජන්තවරයාට උපදෙස් ලැබී තිබුණි.[2]

ඌවේ රාජකීය වෙල් යායක් වූ බදුලුවෙල යළි අස්වැද්දීම සඳහා 1815 ඔක්තෝම්බර් මාසයේදී **බදුල්ලේ අදිකාරම්** තැන සූදානම් විය. එහෙත් ඒ සඳහා තමන්ටත් එහි වගා කටයුතු කරන ගබඩාගමේ මිනිසුන් තිස් දෙනෙකුටත් යැපීම සඳහා සහල් සහ ලුණු ලබාදෙන මෙන් ඔහු රජයෙන් ඉල්ලා සිටියේය.[3] පෙර සිරිතට අනුව වෙල් අස්වැද්දීමේ දී ගබඩාගම්වල වැසියන්ට දීමනාවක් ලබාදීම සිදු නොවන බව ඒ පිළිබඳව සොයාබැලීමේදී ඉංග්‍රීසීන්ට දැනගත හැකි විය.[4] එහෙත් මෙවැනි ඉල්ලීමක්

1. ඩොයිලි විසින් රයිට් වෙත යවන ලද 1816.7.3 දිනැති ලිපිය.
(මෙම ලිපිය ඇතුලු මෙහි සඳහන්ව ඇති සියලු ලිපි ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත්ව ඇති බව සලකන්න).
2. ඩොයිලි විසින් රයිට් වෙත යවන ලද 1816.1.26 සහ 1816.1.31 දිනැති ලිපි.
3. ඩොයිලි විසින් රයිට් වෙත යවන ලද 1816.1.12 දිනැති ලිපිය සහ ඇමිණුමක් ලෙස ඇති කොක්සන්ගේ 30/10/1815 ලිපිය සහ 8/11/1815 ලිපිය.
4. 1817 ජනවාරි 12 වන දින ඩොයිලි විසින් රයිට් වෙත යවන ලද ලිපිය සහ කොක්සන්ගේ 1815.11.08 ඇමුණුම.